# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2019

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල
## மாவட்டச் செயலகம் - காலி
## District Secretariat - Galle



# කාර්යසාධන වාර්තාව

# 2019

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

අංක 06, කොළඹ පාර,

ගාල්ල.

# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

# ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# වැය ශීර්ෂ අංක 261

**අන්තර්ගතය**


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 - | ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01-10 |
| පරිච්ඡේදය 02 - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 11-12 |
| පරිච්ඡේදය 03 - | වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය | 13-29 |
| පරිච්ඡේදය 04 - | කාර්යසාධන දර්ශක | 30-32 |
| පරිච්ඡේදය 05 - | තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 33-34 |
| පරිච්ඡේදය 06 - | මානව සම්පත් පැතිකඩ | 34-40 |
| පරිච්ඡේදය 07 - | අනුකූලතා වාර්තාව | 41-48 |

# 01.පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 896 ක් පුරා විසිරී පැතිරී සිටින 1,129,738 ක් වූ ජනගහනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19ක් හා උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් ඔස්සේ සම්බන්ධීකරණය කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි.

මෙම ජනගහනයෙන් 27.2% ක් කෘෂිකාර්මික අංශය ආශ්‍රිතව ජීවත් වන අතර 27.7% ක් කර්මාන්ත අංශය හා සේවා අංශය ආශ්‍රිතව 45.1% ක් ද සේවා නියුක්ත වී ඇත. ඔවුන්ගේ මෙම කටයුතු වලදී සහ සාමාන්‍ය පොදුජන ජීවිතයේ දී මුහුණපාන විවිධ ආර්ථික සමාජීය හා සංස්කෘතික ගැටළු සහ ප්‍රශ්න වලට විසඳුම් ලබාදීමත්, ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීමත් මෙම කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ සඳහා ජනතාවට පහසුවෙන් ලඟාවිය හැකි පරිදි කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන බස් නැවතුම් පොළට හා ප්‍රධාන දුම්රිය ස්ථානයට ඉතාම සමීපයේ නවීන පන්නයේ සත්මහල් ගොඩනැගිල්ලක මෙම කාර්යාලය ස්ථාපනය වී ඇත. නූතන තාක්ෂණික උපකරණ භාවිත කරමින් නිලධාරින් 161 කින් යුත් කාර්ය මණ්ඩලයක් මඟින් මහජනතාවට සඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ කාර්යයේ නිරතව සිටී. මීට අමතරව විවිධ රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා කාර්යාල රාශියක් ද මෙම පරිශ්‍රය තුළ ස්ථානගතකර තිබීම නිසා මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාදීමේ හැකියාව ලැබී ඇත.

1948 ආරම්භයේ සිට මේ දක්වා ආණ්ඩුවේ ඒජන්තවරුන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් 25 දෙනකු ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු කර ඇත. සෝමරත්න විදානපතිරණ මහතා මෙහි වර්තමාන දිසාපතිවරයා වේ.

## ගාල්ල දිස්ත්‍රික්කය හැඳින්වීම



**පිහිටීම හා භූවිෂමතාව**

උතුරින් කළුතර දිස්ත්‍රික්කය හා රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරින් මාතර දිස්ත්‍රික්කයෙන් ද උතුරින් සහ බටහිරින් ඉන්දියානු සාගරයෙන් ද මායිම්වන ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ සමස්ත වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර 1652කි. බෙන්තොට සිට ගොවියාපාන දක්වා වූ කි.මී.73 ක් දිග පුළුල් වෙරළ තීරයක් ද මෙයට අයත් වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය ගත් විට බොහෝ ස්ථාන තැනිතලා ස්වරූපයක් ගන්නා අතර රට අභ්‍යන්තරයට වන්නට කඳු පිහිටා ඇත. හිනිදුම කන්ද, කබරගල කන්ද, කොන්දගල,තිබ්බොටුවාව කන්ද, කැකිරිහේන, වාඩියහේන, බලගල යනාදි කඳු ඒ අතර වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ භූමිය ප්‍රාග් කේම්බ්‍රිය යුගයට අයත් පාෂාණ වලින් නිර්මාණය වී තිබේ. රෙඩියෙලෝ පොඩිසොලික් පාෂාණය දිස්ත්‍රික්කය තුළ වැඩිම ව්‍යාප්තිය දක්නට ලැබේ. එමෙන්ම දුර්ලභ පාෂාණයක් වූ චන්ද්‍රකාන්ති පාෂාණය අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීටියාගොඩ ප්‍රදේශයේ දක්නට ඇත. වෙරළ ආසන්න කලාපයන්හි භූ ව්‍යුහයන් ලෙස කඩොලාන ශාක වලින් යුතු වගුරුබිම් කලපු හා කොරල්පර දක්නට ඇත. ස්වභාවධර්මයන්හි අපූර්ව නිර්මාණයක් වූ හික්කඩුව කොරල්පර අප රටේ පමණක් නොව විදේශයන්හි පවා ප්‍රසිද්ධියට පත්ව ඇත. එය සංචාරක පරාදීසයක් වන අතර රටේ සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයයි.

නිරිත දිග මෝසම් වැස්ස මඟින් ප්‍රමාණවත් වර්ෂාවක් මෙම ප්‍රදේශයට ලැබෙන අතර මැයි සිට සැප්තැම්බර් දක්වා අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. එයට අමතරව සංවහන වාසුළි ක්‍රියාකාරිත්වයෙන් ද වර්ෂාව ලැබේ. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 190.32 ක් වන අතර සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27.3c° ක් පමණ වේ. ප්‍රදේශය හරහා ගලා බසිනා ප්‍රධාන ගංගාව සිංහරාජ අඩවියෙන් පටන්ගෙන ගිංතොට ප්‍රදේශයෙන් මුහුදට වැටෙන ගිංගඟ වේ. එයට අමතරව බෙං ගඟ, මාදු ගඟ, කොග්ගල ඔය ප්‍රදේශයේ දක්නට ලැබෙන කුඩා ප්‍රමාණයේ ගංගාවන් වේ. කලාපයේ පවතින අධික උෂ්ණත්වය හා අධික වර්ෂාපතනය හේතු කොට ගෙන සශ්‍රික වනාන්තර නිර්මාණය වී ඇත. නිවර්තන තෙත් වනාන්තර ගණයට අයත් වන මෙන්ම ලෝක උරුමයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සිංහරාජ වනාන්තරයේ කොටසක් ද ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයට අයත් වේ.

එමෙන්ම ප්‍රදේශයේ ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන ලෙස රාම රාවණ යුගයට සාක්ෂි දරණ රූමස්සල කඳුවැටිය, ලංකාවේ යටත් විජිත යුගය සංකේතවත් කරමින් මුළු ප්‍රදේශය පුරා තේජස පතුරවමින් විජයමාන වන ගාල්ල කොටුව සහ කොටු පවුර, දෙවොල් දෙවියන්ගේ වාසභූමිය ලෙස සැලකෙන සීනිගම හා වැල්ලේ දේවාල පුදබිම හා බෞද්ධ සිද්ධස්ථාන වශයෙන් වැදගත් වන යටගල හා පරගොඩ පූජා භූමි ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.

ශ්‍රී ලාංකාවේ ජාතික ආදායමට ගාල්ල දිස්ත්‍රික්කයෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වී, තේ, රබර්, පොල්, කුරුඳු වැනි බෝග ප්‍රධාන තැනක් ගනී. එමෙන්ම බෙන්තොට, හික්කඩුව, කොග්ගල, උණවටුන වැනි වෙරළ ආසන්න ප්‍රදේශ සංචාරක ව්‍යාපාරය සඳහා ද, රුකඩ හා වෙස්මුහුණු කැටයම් සඳහා අම්බලන්ගොඩ නගරය ද ප්‍රසිද්ධියක් උසුලයි. ගාලු නගරයට කි.මී. 10 ක් පමණ දුරකින් කොග්ගල නිදහස් වෙළඳ කලාපය පිහිටා ඇති අතර ඉන් ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල පිරිසකට රැකියා පහසුකම් සැලසී ඇත.

ගාල්ල දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් මූලික දර්ශක කිහිපයක් පහත සඳහන් වේ.

| | |
|---|---|
| සාක්ෂරතාවය | 92.95% |
| පුරුෂ | 93.60% |
| ස්ත්‍රී | 92.30% |
| දරිද්‍රතා දර්ශකය | 2.90% |
| පරිගණක සාක්ෂරතාව | 30.20% |
| අන්තර් ජාලය භාවිතය (වයස අවු. 5-69) | 24.80% |
| ඊ මේල් භාවිතය (වයස අවු. 5-69) | 10.50% |

මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ජීවන රටාව**

| විස්තරය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ශ්‍රම බල සහභාගීත්ව අනුපාතය | | | |
| මුළු සංඛ්‍යාව | 52.2 | 52.4 | 49.7 |
| පිරිමි | 73.2 | 70.8 | 69.2 |
| ගැහැණු | 34.7 | 36.5 | 32.6 |
| සේවා නියුක්ත අනුපාතය | | | |
| රැකියා නියුක්ත | 94.9 | 95.6 | 94.7 |
| රැකියා වියුක්ත | 5.1 | 4.4 | 5.3 |
| සේවා වියුක්ත අනුපාතය | | | |
| පිරිමි | 3.8 | 3.6 | 4.0 |
| ගැහැණු | 7.4 | 5.9 | 7.7 |

**සේවා නියුක්තිය**

| අංශය | ප්‍රතිශතය % |
|---|---|
| කෘෂිකාර්මික | 27.2 |
| කාර්මික | 27.7 |
| සේවා | 45.1 |




**ඉඩම් පරිහරණ රටාව - 2019**

| විස්තරය | ප්‍රමාණය (ව.කි.මී.) | ප්‍රතිශතය% |
|---|---|---|
| ගොඩබිම් ප්‍රමාණය | 1,618.27 | 97.96 |
| අභ්‍යන්තර ජලාශ | 33.73 | 2.04 |
| මුළු බිම් ප්‍රමාණය | 1,652.00 | 100.00 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | 811.14 | 49.10 |
| වගා නොකළ මුළු බිම් ප්‍රමාණය | 643.43 | 38.95 |
| වනාන්තර මුළු බිම් ප්‍රමාණය | 197.43 | 11.95 |
| මුළු බිම් ප්‍රමාණය | 1,652.00 | 100.00 |

මූලාශ්‍රය:- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය

**ගොඩ ගොවිතැන -2019**

| **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | **බෝගය** | **බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---:|---|---:|---|---:|---|---:|
| තේ* | 28,844 | කෝපි | 45.25 | බුලත් | 135.17 | දෙහි | 197.41 |
| රබර්* | 4,356 | ගම්මිරිස් | 1,222.93 | පුවක් | 638.63 | කොස් | 1,194.44 |
| පොල්* | 7,333 | කජු | 18.32 | අඹ | 900.96 | කෙසෙල් | 1,347.37 |
| කුරුඳු | 12,313.37 | කරාබු | 13.19 | දොඩම් | 202.44 | පැපොල් | 389.54 |

*යාවත්කාලිකයි
මූලාශ්‍රය :- ජනලේඛන හා සංඛ්‍යාලේඛනදෙපාර්තමේන්තුව

ලංකාවේ ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ඉහත ක්ෂේත්‍රයන් ඔස්සේ ලබාදෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තේ, රබර්, පොල් හා කුරුඳු වැනි භෝග ප්‍රධාන තැනක් ගනී.

දිස්ත්‍රික්කයේ පාරම්පරික කර්මාන්ත අතර පන් පැදුරු, බීරළු රේන්ද, ලී කැටයම්, වෙස් මුහුණු හා රුකඩ ප්‍රධාන තැනක් ගනී.

මාතර කොළඹ අධිවේගී මාර්ගය රටේ සමස්ත ජාතික ආර්ථික සංවර්ධනයට ගාල්ල දිස්ත්‍රික්කයේ දායකත්වය තවත් වැඩි කිරීමට හේතු වී ඇත. එමෙන්ම සංචාරක ව්‍යාපාරයට මෙන්ම ගාල්ල වරාය කටයුතු වලට ද මෙය විශාල පිටු බලයක් වී ඇත.

**වාරි මාර්ග පද්ධතිය**

ගාල්ල දිස්ත්‍රික්කයේ වාරි මාර්ග පද්ධතිය කුඩා වැව් 04 කින් අමුණු 504 කින් සහ ප්‍රධාන නළ මාර්ග 117 කින් සමන්විත වී ඇත. මෙම වාරි මාර්ග පද්ධතිය පාලනය කිරීම හා නඩත්තු කිරීම සිදුකරනු ලබන්නේ ප්‍රධාන රාජ්‍ය ආයතන 03 ක මැදිහත් වීමෙනි.

1. වාරි මාර්ග දෙපාර්තමේන්තුව
2. පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව
3. ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ජනසංඛ්‍යා දත්ත**

2019 වර්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තුගත ජනගහනය 1,129,738 ක් වන අතර පුරුෂ ජනසංඛ්‍යාව 541,745 ක් ද ස්ත්‍රී ජනසංඛ්‍යාව 587,993 ක් ද වේ.

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **පුරුෂ** | **ස්ත්‍රී** | **එකතුව** | **වර්ග ප්‍රමාණය (ව.කි.මී.)** | **ජන ඝනත්වය (ව.කි.මී. 1 ට)** |
|---|---:|---:|---:|---:|---:|
| බෙන්තොට | 25,588 | 27,508 | 53,096 | 74 | 718 |
| බලපිටිය | 33,974 | 37,669 | 71,643 | 55 | 1,303 |
| කරන්දෙණිය | 32,059 | 34,342 | 66,401 | 88 | 755 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඇල්පිටිය | 33,008 | 35,760 | 68,768 | 150 | 458 |
| නියාගම | 18,358 | 19,438 | 37,796 | 109 | 347 |
| තවලම | 16,953 | 17,692 | 34,645 | 178 | 195 |
| නෙළුව | 15,293 | 15,136 | 30,429 | 155 | 196 |
| නාගොඩ | 27,556 | 29,635 | 57,191 | 179 | 320 |
| බද්දේගම | 37,990 | 41,702 | 79,692 | 111 | 718 |
| වැලිවිටිය-දිවිතුර | 14,862 | 16,318 | 31,180 | 60 | 520 |
| අම්බලන්ගොඩ | 29,007 | 31,511 | 60,518 | 52 | 1,164 |
| ගෝනාපීනුවල | 10,902 | 12,212 | 23,114 | 27 | 856 |
| හික්කඩුව | 52,170 | 56,103 | 108,273 | 65 | 1,666 |
| කඩවත්සතර | 51,843 | 56,260 | 108,103 | 24 | 4,504 |
| බෝපේ-පෝද්දල | 25,353 | 28,121 | 53,474 | 30 | 1,782 |
| අක්මීමන | 39,211 | 43,422 | 82,633 | 65 | 1,271 |
| යක්කලමුල්ල | 23,558 | 25,257 | 48,815 | 110 | 444 |
| ඉමදූව | 22,619 | 25,064 | 47,683 | 67 | 712 |
| හබරාදූව | 31,441 | 34,843 | 66,284 | 53 | 1,251 |
| එකතුව | 541,745 | 587,993 | 1,129,738 | 1,652 | 684 |

මූලාශ්‍රය :- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**උෂ්ණත්වය හා වර්ෂාපතන රටාව**

| මාසය | වර්ෂාපතනය (මිමී) | උෂ්ණත්වය ($C^0$) | |
|---|---|---|---|
| | | උපරිම | අවම |
| ජනවාරි | 27.7 | 29.4 | 23.9 |
| පෙබරවාරි | 120.7 | 30.8 | 24.6 |
| මාර්තු | 148.2 | 31.3 | 25.1 |
| අප්‍රේල් | 88.4 | 31.4 | 25.9 |
| මැයි | 269.8 | 30.5 | 26.8 |
| ජුනි | 177.4 | 30.3 | 26.7 |
| ජූලි | 124.5 | 30.0 | 26.7 |
| අගෝස්තු | 426.0 | 29.1 | 25.4 |
| සැප්තැම්බර් | 592.6 | 28.8 | 25.1 |
| ඔක්තෝම්බර් | 604.3 | 29.1 | 24.3 |
| නොවැම්බර් | 309.4 | 30.5 | 24.8 |
| දෙසැම්බර් | 135.3 | 30.4 | 24.3 |

මූලාශ්‍රය:- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 2019

**දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යාලේඛන තොරතුරු - 2019**

| | |
|---|---|
| පළාත | දකුණු පළාත |
| මුළු භූමි ප්‍රමාණය | 1,652 $km^2$ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | 19 |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව | 896 |
| ගම්මාන සංඛ්‍යාව | 2,423 |
| මුළු ඡන්දදායකයින් සංඛ්‍යාව - 2018 | 858,749 |
| ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව | 712 |
| මහ නගර සභා සංඛ්‍යාව | 1 |
| නගර සභා සංඛ්‍යාව | 2 |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 17 |
| සංචාරක නිවාස සංඛ්‍යාව (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) | 2 |
| රජයේ නිවාස සංඛ්‍යාව (ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති) | 64 |
| කලාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව | 4 |
| පාසල් සංඛ්‍යාව | 430 |
| ගුරුවරු සංඛ්‍යාව | 8,617 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | 10 |
| පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව | 23 |
| පළාත් පාලන ආයතන සභිකයන් සංඛ්‍යාව | 479 |
| 2019 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ජන සංඛ්‍යාව | 1,129,738 |

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

| | |
|---|---|
| දැක්ම | • ගාල්ල දිස්ත්‍රික්කය සඳහා විශිෂ්ට රාජ්‍ය සේවාවක් |
| මෙහෙවර | • නිපුණතාවයෙන් හෙබි මානව සම්පත් සහිත දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය පරිපාලන ක්‍රමයක් තුළින් විශිෂ්ට රාජ්‍ය සේවාවක් සහිත දිස්ත්‍රික්කයක් වීම. |

**අරමුණු**

- ➢ මධ්‍යම රජයේ දිස්ත්‍රික් නියෝජිත ආයතනය වශයෙන් කටයුතු කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරි වසම් මට්ටම දක්වා රජයේ පරිපාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.
- ➢ මධ්‍යම රජයේ හා පළාත් සභාව නියෝජනය කරන ආයතන සංස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය නොවන සංවිධාන වලින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන් වල ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කිරීමේ සම්බන්ධීකරණ හා පසුවිපරම් කිරීමේ ප්‍රධාන සම්බන්ධීකාරක ආයතනය ලෙස කටයුතු කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආර්ථිකමය ජීවනෝපාය හා යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිලාභයන් තිරසාර ලෙස ලබා දීම.
- ➢ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දෙන ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රතිලාභ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාමීය මට්ටමට කඩිනමින් සම්ප්‍රේෂණය කර සේවාවන් ලබා දීම සඳහා වැඩ සැලසුම් සකස් කිරීම.
- ➢ දිස්ත්‍රික්කයේ ස්ථිරසාර සංවර්ධන ප්‍රවාහයක් බිහිකිරීම සඳහා ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් ආර්ථික සමාජීය හා සංස්කෘතික දත්ත එක් රැස් කරමින් තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- ➢ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ මහජනතාවට සේවා සැපයීම වෙනුවෙන් විවිධ රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා වෙනුවෙන් ආදායම් එක් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.
- ➢ ගංවතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩගැලීම වැනි විස්තීර්ණ ස්වභාවික ආපදා අවස්ථා වල දී ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි හා උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකින් ද ග්‍රාම නිලධාරී කාර්යාල 896 හි පරිපාලන කටයුතු නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම.
- මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නියෝජිත ආයතනය වශයෙන් ක්‍රියා කරමින් එම ආයතනවල අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටු වන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම හා දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

- විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සපයන සේවාවලදී ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක් රැස් කිරීම, ගිණුම්ගත කිරීම, භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා අදාළ ආදායම් ගණන් දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.
- ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ  දිස්ත්‍රික් නියෝජිත ආයතනය ලෙස ක්‍රියා කිරීම.
- සියළුම මැතිවරණ කටයුතු වල දී මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිත ආයතනය වශයෙන් ක්‍රියා කිරීම.
- දිස්ත්‍රික්කය තුළ ඉඩම් ඔප්පු ලියාපදිංචි කිරීමත්, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ හා අදාළ ලේඛනවල  පිටපත් නිකුත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- නියඟ, ගංවතුර, සුළි සුළං, මුහුද ගොඩ ගැලීම් වැනි විස්තීර්ණ ස්වාභාවික ආපදා අවස්ථාවන්හි දී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු කිරීම තුළින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.
- රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම හා සම්බන්ධීකරණය කිරීම.
- මහජන දුක්ගැනවිලි සඳහා ඵලදායී ප්‍රතිචාරාත්මක ආයතනයක් ලෙස කටයුතු කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ඉඩම් අහිමි පුරවැසියන්ට ඉඩම් කොටසක හිමිකම තහවුරු කිරීම, රජයේ ඉඩම් සංවර්ධනය කිරීම හා ඊට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

1.4 සංවිධාන සටහන



දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම් හා සංවර්ධන)
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ආයතන හා සේවා)
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
ප්‍රධාන අභ්‍යන්තර විගණක
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ
දිස්ත්‍රික් ඉංජිනේරු
සහකාර දිස්ත්‍රික් ලේකම්
පරිපාලන නිලධාරි
ගණකාධිකාරි
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ
ක්‍රම සම්පාදන අංශය
ඉංජිනේරු අංශය
ඉඩම් හා ඉඩම් සංවර්ධන අංශය
සේවා අංශය
ආයතන අංශය
අනුබද්ධිත ආයතන
මූල්‍ය අංශය
කෘෂිකර්ම අංශය
දිවිනැගුම අංශය
අභ්‍යන්තර විගණන අංශය

## 1.5 ප්‍රධාන අංශයන්

1. ආයතන හා සේවා අංශය
2. ඉඩම් හා සංවර්ධන අංශය
3. මූල්‍ය අංශය
4. සැලසුම් අංශය
5. ඉංජිනේරු අංශය
6. අභ්‍යන්තර විගණන අංශය

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගාල්ල කඩවත් සතර
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තවලම
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නියාගම
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අම්බලන්ගොඩ
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරන්දෙණිය
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්පිටිය
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නෙළුව
8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාගොඩ
9. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බලපිටිය
10. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හික්කඩුව

    I. උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්ගම

    II. උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාදම්පාගම

11. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අක්මීමණ
12. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෙන්තොට
13. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හබරාදූව
14. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බද්දේගම

    I. උප ප්‍රාදේශීයලේකම්කාර්යාලය - වඳුරඹ

15. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - යක්කලමුල්ල
16. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බෝපේ පෝද්දල
17. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වැලිවිටිය දිවිතුර
18. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉමදූව
19. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගෝනපීනුවල

## 02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ගාල්ල දිස්ත්‍රික්කය දකුණු පළාතේ වැඩිම ජනගහයක් සිටින දිස්ත්‍රික්කය වේ. ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 5.2% ක් එනම් 1,129,738 ජනගහණයක් ග්‍රාම නිලධාරී වසම් 896 ක් පුරා විසිරී සිටින අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් හා උප ප්‍රාදේශීය කාර්යාල 3 ක් ඔස්සේ සම්බන්ධීකරණය කරමින් ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ ගාලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟිනි. පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය නිලධාරීන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ 92 දෙනෙකු , තෘතියික මට්ටමේ 35 දෙනෙකු , ද්විතියික මට්ටමේ 2720 ක් හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 191 ක් වශයෙන් සමස්ත නිලධාරීන් 3038 දෙනෙකු සේවය කරයි.

02. 2019 වර්ෂය තුළදී ගාල්ල දිස්ත්‍රික්කය සඳහා අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ලෙස පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි.1195 ක් හා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.මි.555 ක් වශයෙන් රු.මි.1750 ක සමස්ත ප්‍රතිපාදනයක් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වෙන් කර තිබුණි. මෙම ප්‍රතිපාදන වලින් වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් වශයෙන් රු.මි.1192 ක් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මි.352 ක් ලෙස රු.මි.1544 ක් උපයෝජනය කර තිබුණි.

03. වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලද ප්‍රමුඛ කාර්යයක් ලෙස ආසන 2000 ක් සහිත නව ශ්‍රවනාගාරයක් ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කිරීම දැක්විය හැක. 2021 වර්ෂයේ අවසාන කිරීමට නියමිත මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වටිනාකම රු.මි.2656 කි. මේ සඳහා 2019 වර්ෂයේදී රු.මි.313 ක් ආයෝජනය කර ඇත. රු.මි.37.8 ක වියදමකින් යුක්තව බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කටයුතු මෙම වසර තුළදී අවසාන කර ඇත. තවද මෙම ගොඩනැගිල්ලට විදුලි සැපයුම ලබා ගැනීම සඳහා රු.මි.1.3 ක් ද ආයෝජනය කර ඇත. හික්කඩුව, හබරාදුව, ගෝනපීනූවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදුලි සෝපාන සැකිලි ඉදිකිරීම සඳහා රු.මි.12.5 ක් ආයෝජනය කර එම වැඩකටයුතු මෙම වසරේදී නිමකර ඇත. නව දිසාපති නිල නිවසද රු.මි.57.2 ක වියදමක් දරා වර්ෂය තුළදී ඉදිකර අවසන් කරන ලදි.මෙම වර්ෂය තුළ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා රු.මි.5ක ආයෝජනයක් කර ඇත.

04. මෙම වර්ෂය තුළ දී ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළුව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 45කින් ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.4,410ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබුණි. මෙම ප්‍රතිපාදන වලින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය, වකුගඩු රෝග නිවාරණ වැඩසටහන, නිල සෙවන කාර්යාල ඉදිකිරීම්, පුරාණ විහාර ප්‍රතිසංස්කරණ, ඌන සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන, ගම් පෙරළිය, විමධ්‍යගත සංවර්ධන වැඩසටහන, ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ මලු ලබා දීමේ වැඩසටහන, පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වේල් ලබා දීමේ වැඩසටහන්, රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි හා පොළී ගෙවීම්, ආබාධිත පුද්ගල දීමනා, වැඩිහිටි දීමනා ලබා දීමේ වැඩසටහන, ගංවතුර හා නාය යෑම් වෙනුවෙන් ආපදාවට ලක් වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම, සංහිඳියාව ප්‍රවර්ධනය සඳහා වූ

ව්‍යාපෘතිය, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘති, සිංහරාජ විශේෂ ඒකාබද්ධ වැඩසටහන, ඇල්පිටිය ආනන්ද විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදිකිරීම, දහම් පාසල් ගුරු දීමනා ලබා දීම, මුස්ලිම් ආගමික ස්ථාන වැඩිදියුණු කිරීම, දුෂ්කර ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යනාදී විශාල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා වෙන්කරන ලද සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මි.2708 ක ආයෝජනයක් සිදුකර තිබූ අතර එය සමස්ථ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස61% කි.

05. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලද ප්‍රතිපාදන වලින් 2019 වර්ෂයේ දී රු.මි. 8.1 ක වියදමක් දරා නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ I වන අදියර හා රු.මි. 8 ක වියදමක් දරා යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ I වන අදියර නිම කරන ලදී. තවද එම ගොඩනැගිලි දෙකෙහි II වන අදියර හා නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමෙහි II වන අදියර යන ව්‍යාපෘති මෙම වර්ෂය තුළදී ආරම්භ කළ අතර එම ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.මි.119 ක් වන අතර මෙම ව්‍යාපෘති 2020 වර්ෂයේ අවසන් කිරීමට නියමිතය.

06. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තම කාර්ය මණ්ඩල සහ අනෙකුත් භෞතික සම්පත් යොදාගෙන මහජනතාව විසින් දැඩි ඉල්ලුමක ඇති සේවා වලට ප්‍රමුඛත්වය ලැබෙන සේ මහජන සේවය කරයි. ඒ අනුව 2019 වර්ෂයේ අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍ර නිකුත් කිරීම් 1,855ක්, පසු අයිතිය නම් නොකළ බලපත්‍ර ඔප්පු අයිතිය ලබා දීම් 1,200 ක් , ව්‍යාපාර නාම බලපත්‍ර නිකුත් කිරීම් 3489 ක් , වාහන අදායම් බලපත්‍ර නිකුත් කිරීම් 226,019 සහ ජාතික හැඳුනුම්පත් සැකසීමේ අයදුම්පත්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු වෙත යොමු කිරීම් 47,315 ක් ඉටු කර ඇත.

07. රාජ්‍ය වෙසක් උත්සවය, පොසොන් උත්සවය, නිදහස් උළෙලට සමගාමීව පැවැත්වෙන දිස්ත්‍රික් උළෙල ආදී උත්සව සංවිධානය කර සාර්ථකව අවසන් කිරීමට 2019 වසර තුළදී හැකියාව ලැබුණි.

08. රජයේ සංවර්ධන ප්‍රතිපත්ති වලට අනුකූලව සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ඉදිරි වසර වලදී තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගත හැකි වන අයුරින් දිස්ත්‍රික්කයේ ජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ඉටු කරලීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් සංවර්ධනය කරගනිමින් හා විද්‍යුත් ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් රාජ්‍ය සේවය වර්තමාන කාලයට ගැලපෙන අයුරින් කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

**සෝමරත්න විදානපතිරණ**

**දිස්ත්‍රික් ලේකම්/දිසාපති**

**ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය**

# 03. පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තතය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මතබදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හාවෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 5,847,549,270 | 5,523,281,550 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 500,601,474 | 589,155,914 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 86,197,398 | 86,958,005 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 328,751,895 | 245,730,611 | |
| - | **මුළු ආදායම් නොවනලැබීම් (ආ)** | | **6,763,100,037** | **6,445,126,080** | |
| - | **මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **6,763,100,037** | **6,445,126,080** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 1,026,827,700 | වැටුප්, වේතන සහඅනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,024,604,064 | 937,372,271 | ඒසීඒ-2(ii) |
| 149,825,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 148,559,969 | 141,892,077 | ඒසීඒ-2(ii) |
| 15,712,300 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 15,604,415 | 14,739,008 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 2,885,000 | වෙනත් පුනරාවර්තනවියදම් | 9 | 2,852,266 | 2,256,604 | |
| 1,195,250,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **1,191,620,714** | **1,096,259,960** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 22,100,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 21,975,565 | 15,003,556 | **ඒසීඒ-2(ii)** |
| 526,900,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 325,079,038 | 128,301,746 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 5,000,000 | හැකියා වර්ධනය | **14** | 4,959,577 | 3,886,999 | |
| 1,350,000 | වෙනත් මූලධන වියදම් | **15** | 42,480 | 666,414,366 | |
| 555,350,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **352,056,660** | **813,606,667** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **442,297,569** | 665,510,347 | |
| - | තැන්පතු ගෙවීම් | | 354,423,425 | 571,547,357 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගෙවීම් | | 87,874,144 | 93,962,990 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 1,985,974,943 | 2,575,376,974 | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයඌ = (ඈ-උ)** | | **4,777,125,094** | **3,869,749,106** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2019 දෙසැම්බර් 31 දිනට

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 3,529,717,556 | 2,358,920,684 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 385,025,103 | 246,669,879 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 9,130,380 | 194,086 |
| මුළු වත්කම් | | **3,923,873,039** | **2,605,784,649.00** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (371,593,254) | (227,091,952.00) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 3,529,717,556 | 2,358,920,684.00 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 157,119,855 | 20,441,377.00 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 599,498,502 | 453,320,454.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 9,130,380 | 194,086.00 |
| මුළු වගකීම් | | **3,923,873,039** | **2,605,784,649.00** |

පිටු අංක..06....සිට ..26... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..27... සිට ..43.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2020 . 02 . 19 |
| දිනය : 20/02/2020 | දිනය : 2020/2/19 | |

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
"නිල මැදුර"
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

සෝමරත්න විදානපතිරණ
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය
2020.02.19

දිල්හානි පී. ලියනගේ
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගාල්ල.

## 3.3 මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

**ජ්සීජ්-සී**

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2019** | **2018** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන්එකතු කරන ලද ආදායම් | 328,751,895 | 245,730,611 |
| අග්‍රිම ලැබීම් | 5,847,549,270 | 5,539,692,512 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 6,176,301,165 | **5,785,423,123** |
| | | - |
| <u>**අඩුකළා : මුදල් වැයකිරීම්**</u> | | - |
| පුද්ගල පඩිනඩි හාමෙමෙහෙයුම් වියදම් | 2,023,440,102 | 1,786,513,227 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,215,116,846 | 1,104,074,930 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලදවියදම් | 2,852,266 | 2,256,604 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 16,410,962 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,241,409,214** | **2,909,255,723** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ ) = (අ) - (ආ)** | **2,934,891,951** | **2,876,167,400** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකරගැනීම් | 121,089,307 | 126,377,024 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **121,089,307** | **126,377,024** |
| <u>**අඩුකළා : මුදල් වැයකිරීම්**</u> | | |
| භෞතික වත්කම්ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 3,060,441,787 | 2,879,532,299 |
| අත්තිකාරම් ගෙවීම් | 132,592,840 | 140,098,304 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **3,193,034,627** | **3,019,630,603** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)= (ඈ) - (ඉ)** | **(3,071,945,320)** | **(2,893,253,579)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **(137,053,369)** | **(17,086,179)** |
| **<u>මූල්‍යක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 500,644,374 | 589,247,432 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **500,644,374** | **589,247,432** |
| **<u>අඩුකළා : මුදල් වැයකිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසුගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 354,460,625 | 571,967,167 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **354,460,625** | **571,967,167** |
| **මූල්‍යක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)** | **146,183,749** | **17,280,265** |
| **මුදල්වල ශුද්ධවෙනස්වීම් (ඔ) = (උ) - (ඒ)** | **9,130,380** | **194,086** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනියහැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් සංකේතය | ආදායම් කේතයේ විස්තරය | 2019 ආදායම් ඇස්තමේන්තුව | | 2019 එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 10.03.07.02 | ලියාපදිංචි කිරිමේ ගාස්තු | 33,973 | - | 38,536 | 113 |
| 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු | - | - | 607 | - |
| 10.03.07.05 | ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 360 | - | 371 | 103 |
| 10.03.07.99 | බලපත්‍ර ගාස්තු හා අනෙකුත් | 7,100 | - | 8,739 | 123 |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුළී | 1,875 | - | 2,323 | 124 |
| 20.02.02.99 | පොළිය - වෙනත් | 9,600 | - | 12,053 | 126 |
| 20.03.02.03 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | - | - | 16,084 | - |
| 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | - | - | 1,286 | - |
| 20.03.02.14 | මෝටර් රථ පනත යටතේගාස්තු | - | - | 92,896 | - |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ | 600 | - | 478 | 80 |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු -අනෙකුත් ලැබීම් | 30,100 | - | 26,917 | 89 |
| 20.04.01.00 | සමාජ සංරක්ෂණ දායක මුදල් | - | - | 77,370 | - |

## 3.6 වෙන්කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

**රු. ,000**

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,165,000 | 1,195,250 | 1,191,621 | 99.70 |
| ප්‍රාග්ධන | 554,000 | 555,350 | 352,056 | 63.39 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | ජනාධිපති කාර්යාලය | ජනපති සදහම් යාත්‍රා, ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර,වකුගඩු රෝගනිවාරණ වැඩ සටහන්, ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන, ත්‍රිපිටකය ලෝක උරුමයක් බවටපත් කිරීම, ග්‍රාම ශක්ති පුහුණු වැඩ සටහන්, දරුවන් සුරකිමු ජාතික වැඩ සටහන, ස්මාර්ට් ශ්‍රී ලංකා, වකුගඩු රෝග නිවාරණ වැඩසටහන ගෙවීම. | 193,814 | 185,109 | 75,173 | 40.61 |
| 2 | ඩිජිටල් යටිතල පහසුකම් තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | අතැති බිල්පත් හා පරිගණක මේස පුටු මිලදී ගැනීම,දෛනික කුලී පදනම මතසේවයේ යෙදෙන පුහුණු ලාභීන් සඳහා,ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (අතැති බිල්පත් සමඟ) ගෙවීම. | 46,444 | 33,874 | 15,102 | 44.58 |
| 3 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | වැටුප් (රාජකාරී ආවරණ දීමනා),අතිකාල හා නිවාඩු දින වැටුප්,ගමන් වියදම්,ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීයඅවශ්‍යතා,තැපැල් හා සන්නිවේදන,විදුලිය හා ජලය,බදු කුළී හා පළාත් පාලන ආයතනබදු,ගොඩනැගිලි සහ ඉදිකිරීම වැඩි දියුණු කිරීම,යන්ත්‍ර හා යන්ත්‍රොපකරණ වැඩිදියුණු කිරීම,ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම,පරිගණකයක් මිලදී ගැනීම සඳහා වැඩසටහන්වලට ගෙවීම. | 8,562 | 8,562 | 7,887 | 92.13 |
| 4 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය | RIT ප්‍රචාරක පුවරු ස්ථාපිතකිරීමට ගෙවීම. | 755 | 755 | 613 | 81.16 |
| 5 | බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය | රාජ්‍ය වෙසක් උත්සවය, බුදුපුත් සුරක්ෂා රක්ෂණ, පුරාණ විහාර ප්‍රතිසංස්කරණය, පූජ්‍ය ග්‍රාම වැඩසටහන,ඌණ සංවර්ධිත දහම් පාසල් ගෙවීම. | 96,013 | 93,591 | 61,667 | 65.89 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 6 | ආරක්ෂක අමාත්‍යාංශය | විධායක පුටු මිලට ගැනීම. | 30 | 30 | 23 | 76.73 |
| 7 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන , උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | උපාධිධාරිදීමනා, විමධ්‍යගත අයවැය වැඩසටහන, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන, ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන, ගම්පෙරළිය,ගමන් වියදම්,ලිපිද්‍රව්‍ය,වෘත්තිය පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ වැඩසටහන්,තැපැල් හා සන්නිවේදන,විදුලිය හා ජලය,වෙනත් වියදම්,පුහුණු වැඩසටහන් වලට ගෙවීම. | 3,379,940 | 3,149,543 | 1,855,477 | 58.91 |
| 8 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සාමාජික දීමනා, සභාපති ලිපිකරු දීමනා, කම්කරු දීමනා, ලිපිකරු දීමනා, ලිපිද්‍රව්‍ය දීමනා ,ශාලා ගාස්තු, සම්මුඛ පරීක්ෂණ දීමනා, ප්‍රගති සමාලෝචන,ප්‍රජා වැඩ මුළු පැවැත්වීම, ලිපිද්‍රව්‍ය ගෙවීම. | 11,940 | 11,940 | 11,173 | 93.57 |
| 9 | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ගමන් වියදම්,ලිපි ද්‍රව්‍ය,ආහාර හා පෝෂණ වැඩසටහන්,වානේ අල්මාරි සහ දේශීය වෛද්‍ය පොත් ලබා ගැනීමට ගෙවීම. | 548 | 548 | 505 | 92.08 |
| 10 | කෘෂිකර්ම , ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ගසහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | බ්‍රාහ්මනවත්ත උතුර දැල් මහන ස්ථානයේ අඩුපාඩු පිළියෙළ කිරීම, කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘති , දියවර පියස සනීපාරක්ෂක පහසුකම් වැඩසටහන,දේපළ ණයපොලී,සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය,වැටුප් ,අතිකාල හා නිවාඩු දිනවැටුප්,කිතුල් සංවර්ධන කටයුතු,ඉන්ධන,ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කරගැනීම,යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම,තැපැල් හා සන්නිවේදන සේවා වලට ගෙවීම. | 70,877 | 70,775 | 50,835 | 71.83 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 11 | කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධනඅමාත්‍යාංශය | ගමන් වියදම්,ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා,ප්‍රාදේශීය ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ය කාන්තා වැඩසටහන් සහ දිස්ත්‍රික් කමිටු රැස්වීම්සඳහා,කාන්තා සවිය වැඩසටහන්,කාන්තා අයිතින් සම්බන්ධිකරණය සහ සුරක්ෂිත කිරීමේවැඩසටහන්,ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ ආහාර මලු,ළමා දිරිය වැඩසයහන්,ළමා සභාරැස්වීම් පැවැත්වීම සඳහා,පූර්ව ළමාවිය සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය සඳහා සහායයන් ,පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වෙල (ලිප ද්‍රව්‍ය වියදම් ඇතුළුව) යන ආදීවියදම් වලට ගෙවීම. | 304,578 | 303,746 | 303,361 | 99.87 |
| 12 | ඉඩම්හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | වැටුප් ,දීමනා,ගමන් වියදම්,දේපළ ණය පොලී,බිම්සවිය වැඩසටහන,රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් වන්දි හා පොළි යන ආදී වියදම් ගෙවීම. | 14,180 | 13,374 | 13,329 | 99.67 |
| 13 | නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | බද්දේගම සංස්කෘතිකමධ්‍යස්ථානයේ වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරිම,අතැති බිල්පත් ගෙවීම. | 6,040 | 6,040 | 6,037 | 99.95 |
| 14 | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | වැටුප් ,දීමනා,ගමන් වියදම්,දේපළ ණය පොලී,ආබාධිත පුද්ගල දීමනා,වැඩිහිටි දීමනාව,5000 දීමනාව ගෙවීමට,උපදේශණ වැඩසටහන්,මව හෝ පියා පමණක් ඇති පවුල් සඳහා ස්වයංරැකියාඅවස්ථා ලබා දීමේ වැඩසටහන,දිස්ත්‍රික් සම්බන්ධිකරණ කටයුතු සඳහා ගෙවීම. | 763,736 | 753,616 | 753,616 | 100.00 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 15 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | ඵලදායීතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඵලදායිතා සංවර්ධනනිළධාරීන්ගේ ගමන් වියදම්,පුහුණු වැඩසටහන්,වැටුප් ,ගමන් වියදම්,වාහන නඩත්තු වියදම්,නිවාස හාසුළු මධ්‍ය පරිමාණ කර්මාන්ත හානි තක්සේරු කිරීම වෙනුවෙන් , හදිසි ආපදා කටයුතුසඳහා, බෝම්බ පිපිරීම හේතුවෙන් මියගිය පුද්ගලයන් සඳහා වන්දි,නායයෑම් හේතුවෙන්අවතැන් වන ජනතාව නැවත පදිංචි කිරීම,2017 වර්ෂයේ ගංවතුර, නාය යෑම් හේතුවෙන්ආපදාවට පත්වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් ගෙවීම. | 441,223 | 441,075 | 423,337 | 95.98 |
| 16 | කඳුරට ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | අතැති බිල්පත් ගෙවීම. | 1,908 | 1,908 | 1,908 | 100.00 |
| 17 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | උපකරණ ලබාගැනීම සඳහා ගෙවීම. | 20,000 | 20,000 | - | 0.00 |
| 18 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය / පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ දෙපාර්තමේන්තුව | වැටුප් ,දීමනා,ගමන් වියදම්,දේපළ ණය පොලී,නිදහස් සමරු උත්සව සංවිධානකටයුතු,ප්‍රා.ලේ.කා.ගොඩනැගිලි විවෘත කිරීමේ වියදම් , පොසොන් උත්සවය සැමරීමේ වියදම්,ආදාහන පූජෝත්සවය සඳහා,ගොඩනැගිලි සහ ඉදිකිරීම් (සංචාරක බංගලා),ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම,කාර්යය මණ්ඩල පුහුණු,නව නිලසෙවන කාර්යාල ඉදිකිරීම, ආසන 2000 නව ශ්‍රවණාගාරය ඉදිකිරීමට අවශ්‍ය වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්මුදල, කඩවත්සතර ප්‍රා.ලේ.කා. ගොඩනැගිල්ල ඉදිකිරීම, දි.ලේ.කා. සඳහා,ගාලු මිශ්‍ර ව්‍යාපෘතියේ දෛනික රාජකාරී කටයුතු සහ විදුලි බිල්පත්,කාර්යාලීය උපකරණ ගෙවීම, වැටුප්, දීමනා, දේපළ ණයපොලී, ගමන් වියදම් , පවිත්‍රතා සේවාව ගෙවීම යන ආදීයට ගෙවීම් කිරීමට. | 1,050,702 | 984,041 | 863,492 | 87.74 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 19 | ජාතික ඒකාබද්ධතා ,රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | වැටුප්, දීමනා, දේපළ ණය පොලී, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය, තැපැල් වියදම්, සංග්‍රහ වියදම්, පුහුණු වැඩසටහන්, සංහිඳියා ප්‍රවර්ධනය පිණිස සහාය ව්‍යාපෘති, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන, කාර්යාල උපකරණ මිලදී ගැනීම, ප්‍රගති සමාලෝචන ගෙවීම. | 15,221 | 15,146 | 10,766 | 71.08 |
| 20 | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | සුබිත පුරවර නගර සංවර්ධන ව්‍යාපෘති වලට ගෙවීම. | 72,434 | 72,434 | 11,220 | 15.49 |
| 21 | නගර සැලසුම් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | අඩු ආදායම් ලාභීන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ගෙවීම. | 65 | 65 | 65 | 100.00 |
| 22 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | සිංහරාජ විශේෂ ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන, දක්ෂිණ සංවර්ධන වැඩසටහන, ඇල්පිටිය ආනන්ද විද්‍යාලය පිහිනුම් තටාකයඉදි කිරීමට ගෙවීම. | 90,370 | 90,370 | 20,845 | 23.07 |
| 23 | විදුලි සංදේශ විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය | වැටුප්, දීමනා, ලිපිද්‍රව්‍ය, ගමන් වියදම්, දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන, විගමණික ක්ෂේත්‍රයට අදාල දැනුවත් කිරීම් ගෙවීම. | 31,024 | 31,024 | 29,134 | 93.91 |
| 24 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | වැටුප්, දීමනා, ගමන්වියදම් , දේපළ ණය පොළී, කාර්යාල උපකරණ මිලදී ගැනීම | 3,793 | 3,793 | 3,766 | 99.27 |
| 25 | බෞද්ධකටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | ගමන් වියදම්, පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන්, ආදාහන පූජෝත්සව, කලා ශිල්ප, දහම් පාසල් ගුරු සහතික පත්‍ර ප්‍රදානය, දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම, දහම් පාසල් පෙල පොත් බෙදා දීම, දහම් පාසල් ගුරුදීමනා, ලිපි ද්‍රව්‍ය, ප්‍රගති සමාලෝචන රැස්වීම්, දහම් පාසල් ගුරු කුසලතාසංවර්ධන වැඩසටහන,ඌණ සංවර්ධිත දහම් පාසල් ගෙවීම. | 58,909 | 58,909 | 50,118 | 85.08 |
| 26 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | ගමන්වියදම්,ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා,පල්ලි වැඩිදියුණු කිරීමට ගෙවීම. | 318 | 318 | 26 | 8.17 |
| 27 | ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | සනීපාරක්ෂක පහසුකම් ගෙවීම. | 603 | 603 | 603 | 100.00 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගීකර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 28 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දොළොස්මහේ පහන වැඩසටහන, ලිපිද්‍රව්‍ය, අගහිඟ කළාකරු වැඩ සටහන, ගමන් වියදම්, කලායතන ආධාර, ඉන්ධන, ජාතික සාහිත්‍ය උත්සවය, ප්‍රගති සමාලෝචන රැස්වීම්, කාර්යාල උපකරණ ලබාගැනීම, අන්තර් කලායතන තරඟාවලිය, ලේඛකාධාර ගෙවීම. | 5,561 | 5,561 | 5,206 | 93.62 |
| 29 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | අතිකාල හා නිවාඩු දිනවැටුප්,ගමන් වියදම්,ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා,වෙනත්,තැපැල් හා සන්නිවේදන,ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම සඳහා ගෙවීම. | 173 | 173 | 108 | 62.75 |
